## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2015

-----------------------------------------------------

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1956 අංක 11 දරන පනතින් සංශෝධිත රබර් පර්යේෂණ ආඥා පනතේ (439 වන අධිකාරිය) 8(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු තිබූ වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන රු.12,826,235 ක් හා වියදම් රු.11,554,513 ක් එකිනෙකට හිලව් කර ශුද්ධ අගය රු.1,271,722 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

(i) වර්ෂය තුල ගෙවූ සේවක පාරිතෝෂික මුදල් රු. 1,040,400 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා රබර් පර්යේෂණ ආයතනය වෙනුවෙන් එකතුව රු. 10,024,075 ක් පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 5,203,205 ක් ලෙස වැරදියට දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 4,820,870 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08

2015 දෙසැම්බර් 31 දිනට ආයතනයට එරෙහිව සේවකයින් විසින් රු. 2,433,157 ක වන්දි ඉල්ලා නඩු 11 ක් පවරා තිබූ අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙන්කිරීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මොණරාගල, කුමාරවත්තේ පැල තවාන් ව්‍යාපෘතිය සඳහා වැය කළ රු. 4,950,638 ක් වසර තුනකට වැඩි කාලයක් කෙරී ගෙන යන වැඩ වශයෙන් දක්වා තිබුණ ද අදාළ වියදම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.830,937 ක් වූ බොල් හා අඩමාණ ණය ශේෂය ණයගැතියන්ගෙන් අඩු නොකිරීම හේතුවෙන් ණයගැති ශේෂය එකී ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු ගිණුම්

ආයතනයේ ණයගැති ලෙජරය අනුව වූ එකතුව රු.370,172 ක් වූ ණයගැතියන් 19 දෙදෙනෙකුගේ ශේෂ සනාථන ලිපි අනුව ශේෂ ශුන්‍ය බව දක්වා තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ජංගම නොවන වත්කම් | 294,545,905 | ස්ථාවර වත්කම් ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ආ) | වෙනත් මූල්‍ය වත්කම් | 1,965,524 | වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා |

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.13,717,213 ක් වූ අයවිය යුතු ශේෂ වලින් රු. 6,248,386 ක් වසර 7ක් ඉක්මවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ දීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජරයේ පැවති එකතුව රු. 21,460,210 ක් වූ වෙළඳ ණයගැති ශේෂ වලින් රු. 14,469,876 ක් එනම් සියයට 64 ක් වසර 10 ඉක්මවා තිබූ අතර තවත් රු. 4,636,295 ක ශේෂ එනම් සියයට 27 ක් වසර 5 සිට වසර 10 අතර විය. එම ණයගැති ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු. 8,713,223 ක් වූ විවිධ ණයගැති ශේෂයෙන් රු.2,863,000 ක් වසර 05 ට වැඩි ණය ශේෂ විය.

(ඈ) 2011 වර්ෂයේ සිට ජාතික විද්‍යා පදනමෙන් මණ්ඩලයට අයවිය යුතු රු. 1,035,600 ක් අයකර ගැනීමට හා 2002 වර්ෂයේ සිට ජනතා පොහොර සමාගමට ගෙවිය යුතු රු. 298,577 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කටයුතු කර තිබුණි.

(ඉ) විවිධ ණයහිමි ශේෂ තුළ ඇතුළත් එකතුව රු. 16,643,553 ක ශේෂය තුළ වසර 10 ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු. 4,324,179 ක් ද, වසර 5 ත් 10 ත් අතර වූ ශේෂවල එකතුව රු.1,900,115 ක් ද වසර 2 ත් 5 ත් අතර වූ ශේෂවල එකතුව රු. 503,538 ක්ද විය.

(ඊ) ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබූ රු.5,214,500 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 102, 103 | සමාලෝචිත වර්ෂය අවසානයට වූ ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ අයිතම 29 ක ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751 | රජයේ ආයතනවලට ලැබෙන භාණ්ඩ ලද වහාම භාණ්ඩ ලේඛන පොතේ සටහන් කල යුතු වුවත් ව්‍යාපෘතිවලින් ලද එකතුව රු. 3,967,781 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2010 දෙසැම්බර් 10 දිනැති අංක1/ 2010 දරන වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ වතු අධිකාරීවරියෙකු වෙත මෝටර් රථ බලපත්‍රයක් නිකුත් කිරීම නිසා ආනයනය කළ මෝටර් රථය වෙනුවෙන් රේගු බදු හා අනෙකුත් බදු සහන ලෙස රජයට සිදු වූ රු.8,090,574 ක අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය | මණ්ඩලයේ ක්‍රියාත්මක වන වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ වැඩසටහන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 36,662,486 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 43,971,568 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,309,082 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වැටුප් වියදම රු. 80,346,675 කින් වැඩිවුවද රජයේ ප්‍රදාන රු. 89,796,800 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණද 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂය හා සැසඳීමේදී 2012 වර්ෂයේදී අඩුවී තිබුණද ඉන්පසු 2013 සිට 2015 වර්ෂය දක්වාම ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මණ්ඩලයට අයත් වතු හතර අතුරින් තුනක්ම සමාලෝචිත වර්ෂයේදී අලාභ ලබා තිබුණු අතර ඉකුත් වර්ෂයේදී රු. 4,750,647 ක් වූ සමස්ත ලාභය සියයට 167 කින් පිරිහී රු. 3,199,674 ක අලාභයක් බවට පත්වී තිබුණි. ඉකුත් වර්ෂයේදී රු. 6,963,763 ක ලාභ ලබා තිබුණු කුරුවිට වත්තෙහි ලාභය සමාලෝචිත වර්ෂයේදී සියයට 143 කින් පිරිහී රු. 3,028,327 ක අලාභයක් බවට පත්වීම ඉහත සමස්ත අලාභය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

එසේ වුවද ඉකුත් වර්ෂයේදී ලාභ ලබා තිබූ ඩාර්ටන්ෆීල්ඩ් වත්තෙහි ලාභය පමණක් සමාලෝචිත වර්ෂයේදී සියයට 25 කින් වර්ධනය වී තිබුණු අතර කුමාර වත්තෙහි අලාභය සියයට 25 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධව විද්‍යාත්මක පර්යේෂණ කළමනාකරණය, පවත්වාගෙන යාම, ධෛර්යමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වේ.

- රබර් සහ රබර් කර්මාන්තය සම්බන්ධ සියලු ගැටළු නිරාකරණය කිරීම,
- රබර් වගාවට/ රබර් පැල වගාවට බලපාන පලිබෝධ දිලීර වැනි රෝගවලට ප්‍රතිකාර කිරීම හා වැලැක්වීම,
- රබර් කිරි වෙළඳපලට ගැලපෙන ආකාරයට පරිවර්තනය කිරීම / උපයෝජනය කිරීම.
- රබර් සහ රබර් වගාවෙන් ලබා ගන්නා සියලු නිෂ්පාදන උපයෝජනය, අලෙවිකරණය, ඉවත් කිරීම.

## 4.2 අරමුදල් උපයෝජනය

ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ වෙන්කර දී තිබූ රු.මිලියන 87.6 කින් සියයට 55 ක් වූ රු. මිලියන 48.49 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඩාර්ටන්ෆීල්ඩ් , නිවිතිගල කැලේ වතුවල අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදනය කරන ලද මුදල උපයෝජනය කර නොතිබුණු අතර ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වෙන් කළ රු. මිලියන 18.5 න් උපයෝජනය කර තිබුණේ සියයට 30 ක් එනම් රු. මිලියන 5.48 ක් පමණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

2005 අගෝස්තු මාසයේදී සහකාර රබර් රසංඥ සේවයට බැඳුනු නිලධාරිනියක් වෙත අනුමත කර තිබූ විදේශ නිවාඩු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 ඔක්තෝබර් 25 දින සිට වසර 1 මාස 10 ක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබූ අතර අනුමත නිවාඩු අවසන් වීමෙන් පසුව 2009 ඔක්තෝබර් 21 දින සිට නැවත සේවයට වාර්තා කර තිබූ නමුත් ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ කළ යුතු අනිවාර්ය සේවා කාලය හෝ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව 2011 ජුනි 01 දින සිට රැකියාවක් සඳහා මාස 06 ක වැටුප් රහිත නිවාඩු අනුමත කර තිබුණි.

(ආ) නැවත 2012 පෙබරවාරි 20 සිට අවස්ථා 02 කදී වැටුප් සහිත සහ රහිත වශයෙන් නිවාඩු අනුමත කර තිබුණු අතර 2016 මාර්තු මාසයේ දී අනුමත නිවාඩු අවසන් වී තිබුණි. එසේ

වුවද 2016 ඔක්තෝබර් වන විටද සේවයට වාර්තා කර නොතිබුණු අතර ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.1 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ ප්‍රමේහි හා ශාඛා අභිජනන දෙපාර්තමේන්තුව සහ Polymer Chemistry දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානී තනතුරේ පවරන රාජකාරී සඳහා ස්ථිර නිලධාරීන් පත්කිරීමට කටයුතු කිරීමකින් තොරව වසර 4 කට වැඩි කාලයක් වැඩ බැලීමට නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඒ සඳහා රු.723,528 ක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරි කපන පිහියක් නිර්මාණය කිරීම සඳහා ආයතනය විසින් පේටන්ට් බලපත්‍රයක් ලබාගෙන තිබූ අතර එය නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික ආයතනයකට දිගින් දිගටම ටෙන්ඩර් පිරිනමා තිබුණි. තවද ආයතනයේ අරමුණුවලට පටහැනිව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුදල් භාවිතා කරමින් මෙම කිරි පිහිය රු. 550 කට මිලදී ගැනීම සිදුකර ලාභ අනුපාතයක් තබාගෙන නැවත රු. 565 කට අලෙවි කිරීම් කර තිබුණි.

**(ආ)** රථගාල සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන කමිටු තීරණයකින් තොරව රු. 9,950,719 කට ප්‍රදානය කර තිබුණි.

**5.2 විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 12 හි 7.4.1 ඡේදය අනුව මාස 03 කට වරක් අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණේ රැස්වීම් 02 ක් පමණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් මිලදීගත්/ ලැබුණු අවස්ථාවේම ලේඛනගත කිරීම හා භෞතික සත්‍යාපනයක් මගින් වත්කම්වල පැවැත්ම තහවුරු කර නොගැනීම |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම. |